## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

### සමාජීය විද්‍යා පීඨය

### සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය

### සංචාරණය සඳහා දෘශ්‍ය මාධ්‍ය - TCRM 28214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "දෘශ්‍ය මාධ්‍ය ඉතිහාසය තුල සිනමාව හා ඡායාරූප ශිල්පයේ බිහිවීම සුවිශේෂී වේ". ඉහත කියමන උදාහරණ අසුරින් විස්තර කරන්න.

(ලකුණු 20)

02. ගෘහස්ථ සංචාරක කර්මාන්තය (Domestic Tourism Industry) දේශීය සංචාරකයන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රවර්ධන කාර්යාංශයට මුද්‍රිත මාධ්‍යය හා විද්‍යුත් මාධ්‍යය කෙසේ භාවිතා කල හැකිද යන්න උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. තරු පංතියේ හෝටලයක් විසින් ආගන්තුකයන් ආකර්ශනය කරගැනීම සඳහා භාවිතා කරනු ලබන දෘශ්‍ය මාධ්‍යය උපක්‍රම මොනවාදැයි උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04. සංචාරකයන් අතර ප්‍රචලිත නොමැති සංචාරක ස්ථානයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වාර්තා වැඩසටහන් (Documentary) කොතරම් දුරට වැදගත්ද යන්න විස්තර කරන්න.

(ලකුණු 20)

05. සංචාරක තිර පිටපත් රචනය කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. "වර්තමානයේදී සංචාරක ගමනාන්තයක් තෝරා ගැනීමේදී සමාජ මාධ්‍යය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉෂ්ට කරනු ලබයි". ඉහත කියමන උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07. ඔබ කැමති සංස්කෘතිකමය වටිනාකමක් ඇති සංචාරක ස්ථානයක් තෝරාගෙන එය ප්‍රවර්ධනය කිරීම සඳහා දෘශ්‍ය මාධ්‍යය යොදා ගත හැකි ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. චාරිකා නියෝජිත ආයතනයක් (Travel Agency) විසින් සංචාරක පැකේජ කට්ටලයක් නිර්මාණය කිරීමෙන් අනතුරුව එය දේශීය හා විදේශීය සංචාරකයන් හට අලෙවි කිරීම සඳහා ෆේස්බුක් සමාජ මාධ්‍යය ජාලය භාවිතා කිරීම කොතරම් දුරට බලපෑමක් සිදු කරයිද යන්න උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

*******************************